# ලංසු සඳහා ආරාධනාවයි

## ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දොළුව

1. දොළුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ මාර්ග 03 ක් සංවර්ධනය කිරීම සඳහා දොළුව ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රාදේශීය ප්‍රසම්පාදන කමිටුවේ සභාපති විසින් පහත සඳහන් සුදුසුකම්වලින් අසාධු ලේඛනගත නොවූ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන කොන්ත්‍රාත්කරුවන්ගෙන් ලංසු ආරාධනා කරනු ලැබේ.

2. ලංසුකරුවන් තෝරා ගැනීමේදී මීට පෙර කර ඇති සාර්ථක ඉදිකිරීම් පිළිබඳව සැලකිල්ලට ගන්නා අතර ඒ පිළිබඳ විස්තර ලංසු සමග ඉදිරිපත් කළ යුතුය. ලංසුවට අදාල වැඩිමනත් විස්තර දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ගිණුම් අංශයේ දුරකථන අංක 081-2415195 අමතා ලබාගත හැකිය.

3. ලංසු විස්තර www.doluwa.ds.gov.lk වෙබ් අඩවියේ " ප්‍රසම්පාදන " තීරුව මගින් තොරතුරු ලබාගත හැකි අතර ලංසු ලියවිලි සඳහා 2026.09.01 දින ප.ව.3.00 දක්වා ගාස්තුව මුදලින් දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් ගෙවා ලබා ගත් කුවිතාන්සියක් ඉදිරිපත් කිරීමෙන් ලබාගත හැකිය.

4. ලංසු ලියවිලිවල ඉල්ලා ඇති තාක්ෂණික මූල්‍ය හා අනෙකුත් සුදුසුකම් සහිත ලේඛනවල සහතික කළ පිටපත් ලංසුව සමඟ ඉදිරිපත් කළ යුතුය.

5. නිසි පරිදි සම්පූරණ කරන ලද ලංසුපත් පිටපත් දෙකකින් සකස් කර මුල් පිටපත හා අනුපිටපත වෙන් වෙන්ව නම් කර මුද්‍රා තබා එක කවරයක බහා 2026.09.02 දින ප.ව.2.00 හෝ ඊට පෙර ලැබෙන සේ ප්‍රාදේශීය ලේකම් සහ ප්‍රසම්පාදන කමිටුවේ සභාපති, ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, දොළුව යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවීම හෝ කාර්යාලයේ තබා ඇති ටෙන්ඩර් පෙට්ටියට බහාලීම කල හැකිය. ලංසුපත් ඉදිරිපත් කරන කවරයේ ඉහල වම් කෙලවර අදාල ලංසුවේ නම සඳහන් කළ යුතුය.

6. ප්‍රමාද වී ලැබෙන සහ නියමිත උපදෙස් අනුව ඉදිරිපත් නොකරන ලංසු ප්‍රතික්ෂේප කෙරේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අනුමත කර ඇති ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන වාණිජ බැංකුවකින් ලබාගත් පහත වගුවේ සඳහන් වටිනාකමින් හා ලංසු විවෘත කරන දින සිට වලංගු දින ගණනින් යුතු කොන්දේසි විරහිත ලංසු සුරක්ෂණ සහතිකයක් හෝ දොළුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සරප් වෙත මුදලින් කරන තැන්පත් කිරීමක් සඳහා වූ ලදුපත ලංසුව සමග ඉදිරිපත් කළ යුතුය. මෙම බැංකුව මඟින් ලබාගන්නා ලංසු සුරක්ෂණ " දොළුව ප්‍රාදේශීය ලේකම් " නමින් ලබාගෙන තිබීම අත්‍යාවශය වේ.

උපලේඛනය

| අනු අංක | කර්මාන්තය | පිරිවැය ඇස්තමේන්තුව (රු. මිලියන) | අවශ්‍ය අවම CIDA ලියාපදංචිය | බැංකු සහතිකය (රු.) | මුදලින් ලංසු සුරක්ෂණය (රු.) | ලංසු සුරක්ෂණය සඳහා දින ගණන | ලංසු ලියවිලි ගාස්තුව (ආපසු නොගෙවන) |
|---|---|---|---|---|---|---|---|
| 01 | මස්ගොල්ල සිට 75 කොටස හරහා යැරෝ හදබිම දක්වා මාර්ගය සංවර්ධනය කිරීම | 35.46 | C-6 & C - 5 & C - 4 | 354,600.00 | 354,600.00 | 2026.12.30 | 3500.00 |
| 02 | හල්ඔය වටගොඩ අප්ලන්ඩ්ස් මාර්ගය සංවර්ධනය කිරීම | 15.76 | C-7 & C - 6 & C - 5 | 157,600.00 | 157,600.00 | 2026.12.16 | 3500.00 |
| 03 | කහවත්ත ග්‍රෝහිල් ප්‍රධාන මාර්ගය සංවර්ධනය කිරීම | 17.34 | C-7 & C - 6 & C - 5 | 173,400.00 | 173,400.00 | 2026.12.16 | 3500.00 |

8. ලංසු භාර ගන්නා වේලාව පසු වූ වහාම විවෘත කරනු ලැබේ. එම අවස්ථාවට ලංසුකරුට හෝ ඔහුගේ නියෝජිතයෙකුට පැමිණ සහභාගි විය හැකිය.

09. ලද ලංසු අතරින් යෝග්‍ය ලංසුවක් පිළිගැනීම හෝ අසම්පූර්ණව ඉදිරිපත් කර ඇති ලංසු ප්‍රතික්ෂේප කිරීමේ සම්පූර්ණ අයිතිය ප්‍රසම්පාදන කමිටුව සතු වන අතර ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

ඩබ්.ජී.වයි.පී. දයාරත්න
ප්‍රසම්පාදන කමිටු සභාපති,
ප්‍රදේශීය ලේකම්,
ප්‍රදේශීය ලේකම් කාර්යාලය, දොළුව

CS CamScanner